Uva Wellassa University

# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## ජාතික සංවර්ධනයට සාඩම්බර දායකයකු වන්න

# අයදුම්පත් කැඳවීම උපකුලපති තනතුර

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පාලක සභාව, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තිය සහ ඉන්පසුව සිදුකළ සංශෝධනවලට යටත්ව සහ 03/2023 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවයි.
අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු හැටතුනකට (63) අඩු විය යුතුය. උපකුලපතිවරයා/වරිය, ඔහු/ඇය ඊට පෙර ධුරයෙන් ඉවත් නොවන්නේ නම් හෝ විශ්වවිද්‍යාල පනතට අනුව ධුරයෙන් ඉවත් කරනු නොලබන්නේ නම්, වසර තුනක කාලයක් සඳහා හෝ ඔහුට/ඇයට වයස අවුරුදු හැටපහක් (65) සම්පූර්ණ වන තෙක්, මින් කුමක් හෝ පළමුව සිදුවන කාලය දක්වා ධුරය දරනු ඇත.
විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ගනන් දීමේ නිලධාරියා ද වේ. ඔහු/ඇය නිල බලයෙන් පාලක සභාවේ සහ සනාතන සභාවේ සාමාජිකයෙකු මෙන්ම සභාපතිවරයා ද වේ. අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ විශ්වවිද්‍යාලයේ පරිපාලනය සඳහා උපකුලපතිවරයා වගකිව යුතුය. ඔහු/ඇය අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය සහ ඵලදායී අපක්ෂපාති නායකත්වය යන මූලධර්ම තහවුරු කළ යුතුය.

### අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය

අයදුම්කරුගෙන් ඔහුගේ/ඇයගේ අයදුම්පත සමඟ පහත සඳහන් ද ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ:

i. විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා වූ දැක්ම පිළිබඳ ප්‍රකාශයක්,
ii. උපකුලපති තනතුරට පත් කරනු ලැබුවහොත් ඔහු/ඇය ළඟා කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්,
iii. අයදුම්කරුගේ උපන් දිනය ද ඇතුළත් සම්පූර්ණ ජීවදත්ත සටහනක් (Curriculum Vitae).

මීට අමතරව, ඉහත ලේඛනවල මෘදු පිටපතක් (soft copy) වෙනත් ඕනෑම අදාළ සහායක ලේඛනයක් සමඟ PDF ආකෘතියෙන් **registrar@uwu.ac.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු වන විට හෝ ඊට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර දරා ඇති විට, ඔහු/ඇය ඉහත සඳහන් කළ (i), (ii) සහ (iii) ලේඛනවලට අමතරව සිය පළමු ධුර කාලය තුළ ලබාගත් ජයග්‍රහණ ඉස්මතු කරමින් වාර්තාවක් ලබා දිය යුතුය.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය හැර වෙනත් රාජ්‍ය සේවයේ, සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු නම්, ඔහු/ඇය අදාළ තනතුරට පත්වුවහොත් සේවයෙන් නිදහස් කළ හැකිද යන්න දක්වමින් සේවායෝජකයාගෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

### තේරීම් ක්‍රියාපටිපාටිය

සියලුම සුදුසුකම් ලත් අයදුම්කරුවන් අවම වශයෙන් මිනිත්තු දහයක (10) කාලයක් සඳහා, එහෙත් මිනිත්තු පහළොවක් (15) නොඉක්මවන කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා විශේෂ පාලක සභා රැස්වීමක් හමුවට කැඳවනු ලැබේ. ඔහුගේ/ඇයගේ දැක්ම ප්‍රකාශයේ, ජීවදත්ත සටහනේ සහ ඉදිරිපත් කිරීමෙහි සඳහන් කරුණු පිළිබඳව වැඩිදුර තොරතුරු ලබාගැනීමට හෝ උපකුලපති තනතුර සඳහා ඔහුගේ/ඇයගේ සුදුසුකම තහවුරු කරගැනීමට ඕනෑම අයදුම්කරුවෙකුගෙන් ප්‍රශ්න කිරීමේ අයිතිය සභාපතිවරයාට හෝ පාලක සභාවේ ඕනෑම සාමාජිකයෙකුට ඇත.

සුවිශේෂී තත්ත්වයක් යටතේ, යම් අයදුම්කරුවෙකුට අසනීප තත්ත්වයක් හේතුවෙන් හෝ විදේශගතව සිටීම හේතුවෙන් විශේෂ පාලක සභා රැස්වීමට පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි නම්, ලේඛකාධිකාරීවරයාට පෙර දැනුම්දීමක් සහිතව අතථ්‍ය ක්‍රමයට (virtual mode) පෙනී සිටීමට ඔහුට/ඇයට අවසර දෙනු ලැබේ.

අංක 03/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ සඳහන් පරිදි පහත සඳහන් නිර්ණායක මත පදනම්ව අයදුම්කරුවන් ඇගයීමට ලක් කරනු ලැබේ.

I. උපායමාර්ගික අවධානය (Strategic Focus)
II. ඵලදායී නායකත්වය (Effective Leadership)
III. සමස්ත චින්තනය / සංකල්පීය කුසලතා (Holistic Thinking/ Conceptual Skills)
IV. අධ්‍යයන සහ පර්යේෂණ විශිෂ්ටත්වය (Academic and Research Excellence)
V. පෞද්ගලික අඛණ්ඩතාව / අවංකභාවය (Personal Integrity)
VI. වෘත්තීය සන්නිවේදනය (Professional Communication)
VII. කළමනාකරණ නිපුණතාව (Managerial Competence)

ඇගයීම් ක්‍රමවේදය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් (**http://www.uwu.ac.lk**) බාගත කරගත හැක. 2023.04.10 දිනැති අංක 03/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි තේරීම සිදු කරනු ලැබේ.

අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදීම මගින් වැඩබලන ලේඛකාධිකාරී, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, 2වන සැතපුම් කණුව, පස්සර පාර, බදුල්ල යන ලිපිනයට 2026.06.04 දින පස්වරු 3.00 ට හෝ ඊට පෙර යොමු කළ යුතුය.
අයදුම්පත සහ ලේඛන අඩංගු ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"උපකුලපති තනතුර"** (Post of Vice-Chancellor) යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**වැඩබලන ලේඛකාධිකාරී / පාලක සභාවේ ලේකම්,**
**ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.**
**(2026.05.03)**